ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 14,490—1965 අගෝස්තු 27 වැනි සිකුරාදා—1965.8.27**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV වැනි කොටස—පළාත් පාලනය

**(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට, වෙන වෙනම පිටු අංක යොදා ඇත.)**


| | පිට | | |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන .. .. .. | 621 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන .. .. .. | 631 |
| තනතුරු—ඇබෑර්තු .. .. .. | 624 | අය-වැය ලේඛන .. .. .. | 632 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය .. .. .. | 628 | දේපළ විකිණීම් .. .. .. | — |
| අතුරු ව්‍යවස්ථා .. .. .. .. | — | මාර්ග කොමිටි දැන්වීම් .. .. .. | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — | විවිධ දැන්වීම් .. .. .. | 634 |


## පළාත් පාලන නිවේදන

ඇල්.ඩී.—බී 69/41.

### ගම්සභා ආඥා පනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 37 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා කෙරෙහි පැවරී තිබෙන බලතල ප්‍රකාර පළාත් පාලන ඇමති මුරුගේසන් තිරුචෙල්වම් වන මම, යාපනේ දිස්ත්‍රික්කයේ පුන්ගුඩුතිවු ගම් ප්‍රදේශයේ ගම් සභාවට ඒ ගම් ප්‍රදේශයෙහි ඉඩම් බද්දක්, ඒ වගන්තිය යටතේ පනවා අය කිරීමට මේ නිවේදනයෙන් බලය පවරමි.

ඈම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 අගෝස්තු මස 8 වැනි දින,
කොළඹ දී ය.

8-1063—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

එල්.ඩි.—බී. 139/46

### විනෝද බදු ආඥාපනත

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ යාපනේ දිස්ත්‍රික්කයේ නෙල්ලියඩි සුළු නගර සභාව විසින් සම්මත කර ගනු ලැබූ පහත දක්වෙන යෝජනාව, පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබ ඒ වගන්තියේ (2) වැනි උපවගන්තියේ ප්‍රකාර එය මෙහි පළ කරනු ලැබේ.

යෝජනාව

" (267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ යටතේ මේ සභාව විසින්, එහි පරිපාලන සීමා ඇතුළත පැවැත්වෙන (ආඥාපනතේ විස්තර කර තිබෙන) විනෝද කටයුතු සඳහා ප්‍රවේශවීම පිණිස අය කරනු ලබන ගෙවීම් වලින් පහත සඳහන් ප්‍රමාණයන් අනුව වූ බද්දක්, මේ යෝජනාව ගැසට් පත්‍රයේ පලවන දින සිට පනවා අය කරනු ලැබේ.

---

## විශෙෂ නිවේදනයයි

1965 සැප්තැම්බර් 10 වැනි සිකුරාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1965 සැප්තැම්බර් 9 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1965 සැප්තැම්බර් 4 වැනි සෙනසුරාදා දහවල් 12 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1965 අගෝස්තු 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

අයකරනු ලබන ගාස්තුව

බද්ද ප්‍රමාණය හැර ප්‍රවේශ ගාස්තුව :—

| | බද්ද ප්‍රමාණය රු. ශ. |
|---|---|
| (අ) ශත 20කට අඩු නොවන්නාවූ එහෙත් ශත 50ට වැඩි නොවන්නාවූවිට ... ... ... | 0 5 |
| (ආ) ශත 50කට වැඩි වන්නාවූ එහෙත් රු. 1.00කට වැඩි නොවන්නාවූ විට ... ... ... | 0 10 |
| (ඇ) රු. 1.00කට වැඩි වන්නාවූ එහෙත් රු. 1.50ට වැඩි නොවන්නාවූ විට ... ... ... | 0 15 |
| (ඈ) රු. 1.50කට වැඩි වන්නාවූ එහෙත් රු. 2.00ට වැඩි නොවන්නාවූ විට ... ... ... | 0 20 |
| (ඉ) රු. 2.00කට වැඩි වන්නාවූ එහෙත් රු. 3.00කට වැඩි නොවන්නාවූ විට ... ... ... | 0 30 |
| (ඊ) රු. 3.00කට වැඩි වන්නාවූ එහෙත් රු. 4.00කට වැඩි නොවන්නාවූ විට ... ... ... | 0 40 |
| (උ) රු. 4.00කට වැඩි වන්නාවූ එහෙත් රු. 5.00කට වැඩි නොවන්නාවූ විට ... ... ... | 0 50 |
| (ඌ) රු. 5.00කට වැඩි වන්නාවූ එහෙත් රු. 10.00කට වැඩි නොවන්නාවූ විට ... ... .. | 1 0 |
| (එ) රු. 10.00කට වැඩි වන්නාවූ විට— | |
| (1) පළමුවැනි රු. 10.00ට ... ... | 1 0 |
| (2) ඊට වැඩිවන එක් එක් රු. 5.00ට හෝ ඉන් කොටසකට | 1 0" |

ජී. ඊ. ගොගර්ලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965.8.14 දින,
කොළඹ දී ය.

8–1067—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## නාවලපිටිය පළාත් ආණ්ඩු සභාව

### නගර සභා ආඥා පනත

(255 වන අධිකාරය වන) නගර සභා ආඥා පනතේ 162 සහ 164 වන වගන්ති යටතේ, නාවලපිටිය නගර සභාව විසින්, මීට යාකොට ඇති උප ලේඛනයෙහි විස්තර කර ඇති බල පත්‍ර සම්බන්ධයෙන්, ඒ බල පත්‍ර සඳහා මේ දක්වා අයකළ හැකිව තිබූ බල පත්‍ර ගාස්තු වෙනුවට, 1966 ජනවාරි 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඒ උප ලේඛනයෙහි නිශ්චිතව සඳහන් ගාස්තු පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. ඒ. ඩේවිඩ් පෙරේරා,
සභාපති,
නාවලපිටිය නගර සභාව.

නාවලපිටිය නගර සභා කායසීාලය,
1965 අගෝස්තු මස 6 වැනි දින.

### උපලේඛනය

| බලපත්‍රයේ ස්වභාවය | වාර්ෂික ගාස්තුව රු. ශ. |
|---|---|
| කිරි පට්ටියක් තබා ගැනීම (එක කිරි එළදෙනකුට) ... | 5 0 |
| කිරි විකිණීම (මෝටර් රියකින් තැනින් තැන ගෙනයාමෙන්) ... | 50 0 |
| කිරි විකිණීම (බයිසිකලයකින් තැනින් තැන ගෙනයාමෙන්) ... | 25 0 |
| මාළු වෙළඳ පිලක් තබා ගැනීම ... ... | 3 0 |
| හොන්ඩර 5 කට වැඩි කරවල වෙළඳ පිලක් තබා ගැනීම ... | 50 0 |
| පුද්ගලික මස් වෙළඳ පිලක් තබා ගැනීම ... ... | 250 0 |
| සිසිල් බීම කර්මාන්ත ශාලාවක් තබා ගැනීම ... ... | 100 0 |
| අයිස් කර්මාන්ත ශාලාවක් තබාගැනීම ... ... | 100 0 |
| ලී බඩු සාප්පුවක් තබා ගැනීම ... ... | 15 0 |
| කොන්ඩා කපන ස්ථානයක් හෝ බාබර් සාප්පුවක් තබා ගැනීම ... | 25 0 |
| බේකරියක් තබා ගැනීම ... ... ... | 25 0 |
| රෙස්ටෝරන්ට් ශාලාවක් තබා ගැනීම ... ... | 20 0 |
| ලොන්ඩරියක් තබා ගැනීම ... ... ... | 25 0 |
| මුද්‍රණාලයක් තබා ගැනීම ... ... ... | 35 0 |
| විකිණීම සඳහා ගැලොම් 50 කට වැඩි පොල්තෙල් ගබඩාවක් තබා ගැනීම ... ... ... | 20 0 |
| ඡායා රූප ගන්නා ස්ථානයක් තබා ගැනීම ... ... | 25 0 |
| හුණු ගබඩා කරන ස්ථානයක් තබා ගැනීම ... ... | 25 0 |
| ගෝනි ගබඩා කිරීම ... ... ... | 25 0 |
| විදුලි කාර්මික හා ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කරන වැඩ පොළක් තබා ගැනීම ... ... ... | 20 0 |
| ස්වර්ණාභරණ සෑදීම සඳහා ස්ථානයක් තබා ගැනීම ... | 50 0 |
| කම්මලක් තබා ගැනීම ... ... ... | 10 0 |
| සත්ව ආහාර ගබඩාවක් තබා ගැනීම ... ... | 25 0 |
| බීඩි සෑදීම ... ... ... | 50 0 |
| වෑල්ඩින් වැඩ පොළක් තබා ගැනීම ... ... | 50 0 |
| ටයර හා ටියුබ්ස් වොල්කනයිස් කරන ස්ථානයක් තබා ගැනීම ... | 5 0 |
| මෝටර් රථ අළුත්වැඩියා කිරීම සඳහා ගරාජයක් තබා ගැනීම ... | 50 0 |
| පැට්‍රොල් ගබඩාවක් තබා ගැනීම ... ... | 250 0 |
| ඩීසල් තෙල් ගබඩාවක් තබා ගැනීම ... ... | 250 0 |
| භූමිතෙල් ගබඩාවක් තබා ගැනීම ... ... | 250 0 |
| කුළු බඩු සඳහා ඇඹරුම් මෝලක් තබා ගැනීම ... | 100 0 |
| තේ කර්මාන්ත ශාලාවක් තබා ගැනීම ... ... | 200 0 |
| බයිසිකල් අළුත් වැඩියා කිරීම සඳහා ස්ථානයක් තබා ගැනීම ... | 5 0 |
| කළු ගල් වලක් තබා ගැනීම ... ... ... | 25 0 |
| කොට්ට 50 කට වැඩියෙන් සිමෙන්ති ගබඩා කිරීම ... | 25 0 |
| බැටරි චාජ් කිරීම සඳහා ස්ථානයක් තබා ගැනීම ... | 10 0 |
| යකඩ බඩු ගබඩාවක් තබා ගැනීම ... ... | 50 0 |
| ඇලුමිනියම් හා පිත්තල බඩු ගබඩාවක් තබා ගැනීම ... | 25 0 |
| දැව මඩුවක් තබා ගැනීම ... ... ... | 25 0 |
| දර මඩුවක් තබා ගැනීම ... ... ... | 10 0 |

8–1066, 1—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පිළිබඳ පනත

1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු අතුරු ව්‍යවස්ථා) පිළිබඳ පනතේ 3 වන වගන්තිය යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ අම්බන-පිනිකහන ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළ කර සිටිනු ලැබේ.

### යෝජනාව

(අ) පළාත් පාලන ඇමති තුමා විසින් සම්පාදනය කරණු ලැබ 1953 අප්‍රේල් මස 10 වන දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළ කරණ ලද්දා වූ, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරණු ලැබ ඒ බැව් 1953 අගෝස්තු මස 7 වන දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරණු ලැබුවා වූ ද පොදු අතුරු ව්‍යවස්ථාවල අංක 1 සිට 37 දක්වා වූ කාණ්ඩ ද,

(ආ) උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ 1965 ජනවාරි මස 8 වන දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පමුණුවනු ලැබුවා වූ එකී අතුරු ව්‍යවස්ථා මාලාවේම අංක 38 දරණ කාණ්ඩය ද.

මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවූ දින සිට ක්‍රියාත්මක වන අන්දමින් සම්මත කර ගැනීමට අම්බන-පිනිකහන ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පිළිබඳ පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

සනත් ගුණවර්ධන,
සභාපති, අම්බන-පිනිකහන ගම්සභාව.

ගම්සභා කාර්යාලය,
අම්බන-පිනිකහන,
කහදූව,
1965 අගෝස්තු 20.

8–1064—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

## 1952 කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වෙනි වගන්තිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ, පනාවල් කෝරලේ (නැගෙනහිර සහ බටහිර) ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර, මෙයින් පළ කර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වෙනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දා වූ ද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965 ජනවාරි මස 8 වෙනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දා වූ ද, පොදු ආදර්ශ අතුරුව්‍යවස්ථාවල 38 වන කාණ්ඩය, මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළ වන දින සිට සම්මත කර ගැනීමට පනාවල් කෝරලේ (නැගෙනහිර සහ බටහිර) ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වන පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනාකර සිටිනු ලැබේ.

ආර්. ඇම්. මුදියන්සේ,
සභාපති තැන.

1965 ජූනි 10 වන දින,
පනාවල, පනාවල්කෝරලේ (නැගෙනහිර සහ බටහිර)
ගම්සභා කාර්යාලයේ දී ය.

8–1085—65.8.27 දින අංක 14,940 දරන ගැසට් පත්‍රය

---

## 1952 කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ මැදසිය පත්තු ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව, එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ, 1963.6.21 වන දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පලකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965. 1. 8 දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 වන කාණ්ඩය, මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පලවන දින සිට සම්මත කර ගැනීමට මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ මැදසිය පත්තු ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පණතේ (261 වන පරිච්ඡේදයේ) 3 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

යූ. ඇල්. අබ්දුල් මජීඩ්,
මාතලේ මැදසිය පත්තු ගම්සභාවේ සභාපති තැන.

1965 ක්වූ ජූලි මස 1 වන දින, උකුවෙල,
මාතලේ මැදසිය පත්තු ගම්සභා කාර්යාලයේදීය.

8–1089—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## 1952 කේ අංක 6 දරණ පළාත් පලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ මාරඹ ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තිය ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 නේ ජූනි මස 21 දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූ ද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනලද බව 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශකරන ලද්දාවූ ද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 කාණ්ඩය, මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට මාරඹ ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වන පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

පීටර් පතිරණ,
සභාපති තැන.

1965 ක්වූ ජූලි මස 22 දින,
මාරඹ ගම්සභා කාර්යාලයේදීය.

8–1088—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## ගාලු දිස්ත්‍රික්කයේ රත්ගම ගම්සභාව

### පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වෙනි වගන්තිය යටතේ ගාලු දිස්ත්‍රික්කයේ රත්ගම ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

"පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සම්මත කරනු ලැබූ, 1963 ජූනි මස 21 වෙනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලය සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරන ලද බව 1965 ජනවාරි මස 8 වන දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයෙහි පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 (කරනවෑම් සහ බාබර් සාප්පු) වන කොටස, මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට ගාලු දිස්ත්‍රික්කයේ රත්ගම ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වන අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ."

ඊ. බී. ගුණතිලක,
රත්ගම ගම්සභාවේ සභාපති.

වර්ෂ 1965 ක්වූ අගෝස්තු මස 14 වෙනි දින,
දොඩන්දූව, රත්ගම ගම්සභා කාර්යාලයේ දී ය.

8–837—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## වේයන්ගොඩ සුළු නගර සභාව

### සුළු නගර සහා ආඥාපනත

### 1965 වර්ෂය සඳහා විශේෂ කසල ශෝධන බද්ද

256 වෙනි අධිකාරිය වන සුළු නගර සභා ආඥා පණතේ 129 (ඕ) වගන්තිය යටතේ හා ඒ වගන්තියෙන් ගරු පළාත් පාලන ඇමතිතුමා කෙරෙහි පැවති ඇති බලතල ප්‍රකාර දෙනු ලැබුන එතුමාගේ අනුමැතිය ඇතිව සුළු නගර සභාව විසින් අනුමත කරණු ලැබිය හැකි යම් යම් සීමා කිරීම්, සුදුසුකම් හා කොන්දේසිවලට යටත්ව, පිළිවෙලින් මාර්තු 31 ජූනි 30, සැප්තැම්බර් 30, සහ දෙසැම්බර් 31 යන දිනයන්හි සම කොටස් හතරකින් ගෙවා අවසාන කළහැකි අන්දමට, වේයන්ගොඩ සුළු නගර සභා සීමාවතුල පිහිටා ඇති වාර්ෂික වටිනාකම රු. 25 කට නොඅඩු සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට තුනක්වූද, විශේෂ කසල ශෝධන බද්දක් 1965 වර්ෂය සඳහා වේයන්ගොඩ සුළු නගර සභාව විසින් පසුගිය වර්ෂය තුලදී බලපැවත්වූ ආකාරයටම පනවා ඇති බව මෙයින් නිවේදනය කරණු ලැබේ.

ජී. ඒ. ඩී. ඇල් තිලකරත්න,
වේයන්ගොඩ සුළු නගර සභාවේ සභාපති.

1965 අගෝස්තු 9,
වේයන්ගොඩ.

8–1086—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

8. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශිය බලමණ්ඩලයේ සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුව හොත් ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදාහරින්නට තමන් සූදානම් ව සිටින්ද නැත්දැයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) **මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත්** නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) **අයදුම්පත් වනාහි මීට යාකොට ඇති ආකෘතියට සාරානුකූලව පිළියෙල කොට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.**

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම් පතක් තැපැලේදී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම් පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය

### පළාත් පාලන සේවය

**සැ. යු.**—(i) අයදුම්පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුර අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර සභාපතිගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරගනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැලකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ ස්වකීය අයදුම්පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි-සිංහල, දෙමළ යන භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාල වෙනම වෘත්තීය ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

———————තනතුර සඳහා වූ අයදුම්පතයි

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය : ————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.
ජාතිය :————.
(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් හැඳුනුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස :
අවුරුදු——, මාස———, දින———.

(ආ) උපන් දිනය :————.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.
(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි).

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ හෝ ශිල්පීය සුදුසුකම්, ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස්වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂා වෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය යම් කලක නතර කරන ලද්දේ නම් එසේ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු), පළාත් පාලනායතන හා කාල සීමාවන් : ————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය : ————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම් :—

සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කොතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හැකියාවන් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————. (ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

## පළාත් පාලන සේවය

### ඉංජිනේරු තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි. තෝරාගනු ලබන අයදුම්කරුවන් පළමු වරට කොළඹ නගර සභාවට පත්කරනු ඇත.

2. වැටුප.—තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය—රු. 4,080—360×12 සහ 480×10—රු. 13,200—රු. 11,280 යන වාර්ෂික වැටුප උඩ දැවුරුදු නැවැත්වීමක් සහ රු. 9,360, රු. 11,760 යන වාර්ෂික වැටුප්වලට පළමු කාර්යක්ෂමතා කඩයිම් ඇත.

සටහන.—(1) ඒ.ඇම්.අයි.සී.ඊ. හෝ නාගරික ඉංජිනේරු ඒ.ඇම්.අයි. සුදුසුකම් නැති අයට, ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ රු. 8,880 යන වාර්ෂික වැටුප් පියවර ඉක්මවිය නොහැක.

(2) ඒ.ඇම්.අයි.සී.ඊ. සහතිකය ඇති අය, රු. 5,880 ක වාර්ෂික වැටුපකින් ද, නාගරික ඉංජිනේරු ඒ.ඇම්.අයි. සහතිකය ඇති අය, රු. 5,520 ක වාර්ෂික වැටුපකින් ද, ඉහත සඳහන් වැටුප් ක්‍රමයෙහි වැටුප් ලැබීම ආරම්භ කරයි.

(3) අයදුම්කරුවකුගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව වැටුප් ක්‍රමයේ යථා පියවරක තබා වැටුප් ගෙවිය හැකිද වේ.

3. අවශ්‍ය සුදුසුකම් :—

(අ) වයස.—1965 සැප්තැම්බර් මස 14 වැනි දිනට අවුරුදු 50 ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවනට පිළිගත් විශ්ව විද්‍යාලයක සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ බී.ඇස්.සී. (ඉංජිනේරු) උපාධිය හෝ නාගරික ඉංජිනේරු ඒ.ඇම්.අයි. විභාගය හෝ ඒ.ඇම්.අයි. සී.ඊ. විභාගයේ 1 සහ 2 යන අංශයන් ගෙන් සාමාර්ථයක් හෝ ඊට වඩා උසස් සුදුසුකමක් තිබිය යුතුයි.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට, 1965 සැප්තැම්බර් මස 14 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

6. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාර දී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

7. සුදුසු අයදුම්කරුවන්ගේ අයදුම්පත් පමණක්, ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1965 අගෝස්තු මස 19 වැනි දින,
තැ. පෙ. 530,
කොළඹ.

8-1077—65,8,27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන සේවය

### පශු පරීක්ෂක තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත්‍ර කැඳවයි. තෝරාගනු ලැබූ අයදුම්කරු පළමුවරට කොළඹ නාගරික සභාවේ පශු වෛද්‍ය දෙපාර්තමේන්තුවට පත් කරනු ලැබේ.

2. වැටුප : තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රු. 1,380—120×15—රු. 3,180. මෙහි රු. 2,220 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩයිමකි.

3. අවශ්‍ය සුදුසුකම් :—

(අ) වයස : 1965.9.14 වැනි දිනට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවන්ට පිළිගත් ආයතනයකින් ලබාගත් කිරිපට්ටි පිළිබඳ හෝ සත්ව පාලනය පිළිබඳ හෝ ඩිප්ලෝමෝ සහතිකය නැතහොත් පේරාදෙණියේ කෘෂිකර්ම පාඨශාලාවේ සහතිකය හෝ තිබිය යුතුය.

අයදුම්කරුවනට සත්ව පාලන වැඩ ගැන පළපුරුද්ද තිබිය යුතුයි. ගවයින් බලාගැනීම හා පාලනය පිළිබඳ පළපුරුද්ද අත්‍යාවශ්‍යය. ඔවුන් හොඳ ශාරීරික පෙනුමෙන් සිටිය යුතුය.

4. පළාත් පාලන සේවයේ ජ්‍යෙෂ්ඨ පශු ඕවර්සියර්වරුන්ගේ අයදුම්පත් ද වයස හා වෘත්තීය සුදුසුකම් ගැන නොතකා භාරගනු ලැබේ. එහෙත් එසේ භාරගනු ලබන්නේ 1965.9.14 දිනට අවුරුදු 10 කට නොඅඩු වන පශු කාර්ය පිළිබඳ පළපුරුද්දක් ඇතහොත් ය.

5. මේ ගැසට් පත්‍රයේ 4 වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙළ කොට, 1965.9.14 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි. සඳහන් කරන ලද ආකෘති පත්‍රයේ 13 වැනි 16 වැනි කොටුවල විශේෂ සුදුසුකම් යටතේ පහත සඳහන් කරුණු යොදාගත යුතුයි :—

"13. (ඒ) කිරිපට්ටි සහ/හෝ සත්ව පාලනය පිළිබඳ සුදුසුකම් (සහතිකවල පිටපත් අමුණන්න.) :————.

(බී) ඉහත සඳහන් සුදුසුකම් ලබාගත් ආයතනය සහ ඒවා ලබාගත් දිනය :————.

16. පළපුරුද්ද :—

(ඒ) සත්ව පාලන කටයුතු :————.

(බී) ගවයින් බලාගැනීම හා පාලනය :————.

(සී) සාමාන්‍ය පශු කාර්යයන් :————.

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. සුදුසු අයදුම් පත් පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යලය,
තැ. පෙ. 530, කොළඹ,
1965 අගෝස්තු මස 19 දින.

8–1097—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### ඉංග්‍රීසි වාර්තාකරු තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත්‍ර කැඳවයි.

2. වැටුප : තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රු.3,900—180×8—240×1—රු. 5,580.

3. **අවශ්‍ය සුදුසුකම් :** අයදුම්කරුවනට මිනිත්තුවකට වචන 150 ක වේගයෙන් ලඝු හනින් සටහන් කර ගැනීමට හා ඒවා සියයට 95 ක නිවැරදිතාවෙන් පිටපත් කළ හැකිවිය යුතුය. සභා රැස්වීම්වල කටයුතු වාර්තා කිරීම පිළිබඳ පළපුරුද්ද ඇත්තන්ට විශේෂ සැලකිල්ල දැක්වේ. ලඝු ලේඛනය පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වේ.

4. මේ ගැසට් පත්‍රයේ 4 වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම්පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට, 1965 සැප්තැම්බර් මස 14 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි. සඳහන් කරන ලද ආකෘති පත්‍රයේ 13 වැනි කොටුවේ විශේෂ සුදුසුකම් යටතේ පහත සඳහන් කරුණු යොදාගත යුතුයි :—

(අ) ලඝු ලේඛනය.

(ආ) යතුරු ලේඛනය.

6. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතු වූ පිළිගතහැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

7. සුදුසුකම් ඇති අපේක්ෂකයන්ගේ ඉල්ලුම්පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1965 අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ, තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

8–1096—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### කායශීල කායශී සහායක තනතුර—නවදුන් කෝරළේ උඩපත්තුව ගම් සභාව

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—වර්ෂයකට රුපියල් 540—30 × 8—24 × 1—රු. 804. රු. 636 සහ රු. 732 යන වාර්ෂික වැටුප් වලට පළමු කායශීක්ෂමතා කඩඉම් ඇත.

3. අවශ්‍ය සුදුසුකම්—

(අ) වයස.—1965 සැප්තැම්බර් මස 7 වැනි දිනට වයස අවුරුදු 20 ට නොඅඩු 30 ට නොවැඩි විය යුතු සි.

(ආ) අපේක්ෂකයෝ සිංහල 6 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුත්තාහ.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බලමණ්ඩල ස්ථිර සේවයේ සිටින සේවකයන්ගේ අයදුම්පත්‍ර, ඔවුන් අතින් සුදුසුකම් ලබා ඇත්නම්, වයස නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙලකොට, 1965 සැප්තැම්බර් මස 7 වැනි දිනට හෝ ඊට පළමු නවදුන් කෝරළේ උඩපත්තුව ගම්සභාවේ සභාපති වෙත ලැබෙන්ට එවිය යුතුය.

ව. ආ. කරුණාසේන,
නවදුන් කෝරළේ උඩපත්තුව ගම්සභාවේ
සභාපති.

1965 අගෝස්තු මස 6 වැනි දින,
පැල්මඩුල්ල, නවදුන් කෝරළේ උඩපත්තුව,
ගම්සභා කායශීලයේ දී ය.

8–423—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන සේවය

**මුරකරු තනතුර—මිනුවන්ගොඩ සුළුනගර සභාව**

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රුපියල් 540—30×8—24×1—රු. 804. රු. 636 සහ 732 වාර්ෂික වැටුප් වලට පළමු කාර්යක්ෂමතා කඩයිම් ඇත.

3. **අවශ්‍ය සුදුසුකම්.**—

(අ) වයස.—65. 9. 14 වැනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු 40 ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල 5 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුත්තාහ. දෙවැනි භාෂාව පිළිබඳ ක්‍රියාත්මක දැනීමක් අතිරේක සුදුසුකමක් වනු ඇත. හොඳ ශාරීරික පෙනුමකින් යුක්ත විය යුත්තාහ.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බලමණ්ඩල සථිර සේවයේ සිටින සේවකයන්ගේ අයදුම්පත්‍ර, ඔවුන් අනික් සුදුසුකම් ලබා ඇත්නම්, වයස නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 65.9.14 වැනි දිනට හෝ ඊට පළමු මිනුවන්ගොඩ සුළුනගර සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි.

ඩී. ඩී. විජේතුංග,
මිණුවන්ගොඩ සුළුනගර සභාවේ සභාපති.

1965 අගෝස්තු මස 5 වැනි දින,
මිනුවන්ගොඩ සුළු නගර සභා
කාර්යාලයේ දී ය.

8—523—65.8.27 අංක 14,490 දරණ ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

**කාර්යාල කාර්ය සහායක තනතුර—උඩුව පළාත ගම් සභාව**

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රුපියල් 540—30×8—24×1 රු. 804. රු. 636 සහ රු. 732 යන වාර්ෂික වැටුප් වලට පළමු කාර්යක්ෂමතා කඩයිම් ඇත.

3. **අවශ්‍ය සුදුසුකම්.**—

(අ) වයස.—1965 සැප්තැම්බර් මස 14 වැනි දිනට වයස අවුරුදු 20 ට නොඅඩු 30 ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල 6 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුත්තාහ.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බලමණ්ඩල සථිර සේවයේ සිටින සේවකයන්ගේ අයදුම්පත්‍ර, ඔවුන් අනික් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට, 1965 සැප්තැම්බර් මස 14 වැනි දිනට හෝ ඊට පළමු උඩුව පළාත ගම් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි.

ජේ. ප්‍රේමදාස,
උඩුව පළාත ගම් සභාවේ සභාපති.

1965 අගෝස්තු මස 6 වැනි දින,
උඩුව පළාත,
ගම්සභා කාර්යාලයේ දී ය.
බුලත්කොහුපිටිය.

8—515—65.8.27 අංක 14,490 දරණ ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් පාලන සේවය

**පළාත් පාලන සේවයේ වෘත්තීය සුදුසුකම් නොලත් සහකාර ඉංජිනේරුවරුන්ගේ ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාගය—1965**

පළාත් පාලන සේවයේ වෘත්තීය සුදුසුකම් නොලත් සහකාර ඉංජිනේරුවරුන්ගේ (විදුලිය) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලැබීමේ විභාගයක් පළාත් පාලන සේවයේ I හා II වැනි ශ්‍රේණින්හි විදුලිය අධිකාරීන් සඳහා කොළඹ දී පවත්වනු ලැබේ. විභාගය පවත්වනු ලබන්නේ පළාත් පාලන සේවා කොමිෂම සභාව විසිනි. විභාගය පවත්වන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

2. **වැටුප් හා සේවා කොන්දේසි.**—(ඒ) සමත්වන අයදුම්කරුවෝ වර්ෂයකට රු. 5,160—9×360 සහ 1×480—රු. 8,880 යන වැටුප් ක්‍රමය තිබිපළාත් පාලන සේවයේ වෘත්තීය සුදුසුකම් නොලත් සහකාර ඉංජිනේරු (විදුලිය) වරුන්ගේ ශ්‍රේණියේ තනතුරුවලට පත් කරනු ලැබේ. රජයේ ප්‍රමාණයන්ට හා නියමයන්ට අනුව ගෙවල් කුලී දීමනා, තාවකාලික ජීවන වියදම් දීමනා හා විශේෂ ජීවන වියදම් දීමනා ද ගෙවනු ලැබේ.

(බී) සමත්වන අයදුම්කරුවෝ අවුරුද්දක කාලයකින් පසු ස්ථිර කිරීමට යටත්ව පත් කරනු ලැබේ. ඔවුන් ලංකාවේ ඕනෑම ස්ථානයකට පත් කර යැවිය හැකිය. ඔව්හු ප. පා. සේ. ආඥාපනතට (264 පරිච්ඡේදය) සහ ඒ පිළිබඳව තව දුරටත් කෙරෙන සංශෝධනයන්ට සහ එම ආඥාපනත යටතේ සම්පාදිත වෙනත් රෙගුලාසිවලට ද යටත් වෙති.

3. **සුදුසුකම්.**—1965 සැප්තැම්බර් මස 14 වැනි දිනට හෝ ඊට පෙර සිය තනතුරුවල ස්ථිර කොට ඇති පළමු වැනි ශ්‍රේණියේ විදුලිය අධිකාරීන් සහ දෙවැනි ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩයිම් විභාගය සමත් කොට ඇති දෙවැනි ශ්‍රේණියේ විදුලිය අධිකාරීන් මෙම විභාගයට ඉල්ලුම් කිරීමට සුදුස්සෝ වෙති.

4. **අයදුම්පත්.**—(ඒ) විභාගයට ඇතුළත්වීමේ අයදුම්පත් මෙහි පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයෙහි පිළියෙළ කොට, " සභාපති, පළාත් පාලන සේවා කොමිෂන් සභාව, තැ. පෙ. 530, කොළඹ " යන ලිපිනයට එවිය යුතුයි.

(බී) අයදුම්පත් 1965 සැප්තැම්බර් මස 14 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. එම දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(සී) අයදුම්කරුවන් සිය අයදුම්පත්, තමා දනට සේවයේ නියුක්ත ප්‍රාදේශීය බල මණ්ඩලයේ ප්‍රධාන තැනගේ මාර්ගයෙන් එවිය යුතුයි. මෙසේ කිරීමට යම් අපේක්ෂකයකු අපොහොසත් වුවහොත්, ඔහු නුසුදුස්සකු ලෙස සලකනු සලකනු ලැබේ.

(ඩී) 1965 සැප්තැම්බර් මස 14 වැනි දින හෝ ඊට ප්‍රථම පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන සේ ඉදිරිපත් කරන ලෙස ඉල්ලා තමා සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධානතුමා වෙත සිය අයදුම්පත් කල්වේලා ඇතිව ඉදිරිපත් කරන ලෙස අපේක්ෂකයින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

5. **විභාගයට ඇතුළත් කර ගැනීම.**—(i) පිළිගනු ලැබූ අයදුම් පත්‍ර හිමි අයදුම්කරුවන්ට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති ප්‍රවේශ පත්‍ර නිකුත් කරයි. විභාගයට පෙනී සිටින අයදුම්කරුවෝ, ස්වකීය ප්‍රවේශ පත්‍ර විභාගය පරිපාලනය සඳහා පත් කරනු ලැබ සිටින නිලධාරියාට ඉදිරිපත් කළ යුතුයි. එසේ ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් නොකරන අපේක්ෂකයින් නුසුදුස්සන් බවට පත් කරනු ලැබේ.

(ii) අයදුම්කරුවන් තමාට නියමිත විභාග ශාලාවෙහි විභාගයට පෙනී සිටිය යුතුයි. තමාට නියම කොට ඇති විභාග ශාලාව හැරෙන්නට වෙනත් එකක විභාගයට පෙනී සිටීම සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට අවසර නොදෙනු ඇත.

(iii) ප්‍රවේශ පත්‍රයක් සමග කාල සටහන් පිටපතක් ද අයදුම්කරුවන්ට එවනු ලැබේ. විභාගයට පෙනී සිටින සැම අයදුම්කරුවෙකුම විභාගය පැවැත්වෙන දිනයේ දී ස්වකීය ප්‍රවේශ පත්‍රය විභාග ශාලාව භාර නිලධාරියාට ඉදිරිපත් කළ යුතුයි.

(iv) විභාගය පැවැත්වෙන දිනයට යටත් පිරිසෙයින් දින 7 කටවත් පළමු ස්වකීය ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත්, ඒ බව වහාම " පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති, තැ. පෙ. 530, කොළඹ " යන ලිපිනයට දැනුම් දිය යුතුයි. ඇතුළත් වීමේ ප්‍රවේශ පත්‍ර නොලැබුණ බව දැනුම් දෙන අතරම, පහත සඳහන් තොරතුරු ද සැපයිය යුතුයි :—

(i) විභාගයේ නම :————

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————

(iii) සම්පූර්ණ ලිපිනය :————

6. මේ විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ ඇතුළත්වීම අවලංගු කරන්නට පිළිවන.

7. **විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු.**—පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති විසින් පිළිගනු ලැබූ අයදුම් පත් හිමි, ප්‍රාදේශීය බලමණ්ඩලවල සේවයේ නියුක්ත නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා රාජකාරි නිවාඩු දෙනු ලෙස, ප්‍රාදේශීය බල මණ්ඩලවල ප්‍රධානීන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

8. **හඳුනා ගැනීමේ පත්.**—තමා පෙනී සිටින එක් එක් විෂයයක් පාසා විභාග ශාලා භාර නිලධාරියාට අයදුම්කරු තමා බව ඒත්තු ගැන්විය යුතුයි. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් පිළිගනු ලැබේ:—

(ඒ) තැපැල්පතිතුමා විසින් නිකුත්කරනු ලබන හඳුනා ගැනීමේ පතක් ;

(බී) මේ විභාගයේ දිනයට කලින් අවුරුදු 3 ක කාලසීමාව ඇතුළත දී නිකුත් කරන ලද වලංගු පාස්පෝට් පත්‍රයක්;

(සී) මේ විභාගය පවත්වන දිනට කලින් අවුරුදු 3 ක කාලසීමාව ඇතුළත රජයේ දෙපාර්තමේන්තුවක් මගින් නිකුත් කරන ලද අයිතිකරුගේ ඡායාරූපයක් සහිත සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ වෙනත් ලියවිල්ලක්.

විභාග ශාලාවේ දී තමාගේ හැඳින්වීමේ පත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින් නුසුදුස්සන් බවට පත් කරනු ලැබේ.

9. **විභාග පරිපාටිය.**—විභාගය සඳහා නියමිත විෂයයන් පහත දැක් වේ:—

ලකුණු

I. දෙපාර්තමේන්තු සංවිධානය සහ මුදල් කටයුතු ... ... 100

ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි විදුලිය දෙපාර්තමේන්තුවේ මුදල් සැලැස්ම හා කළ හැකි වැඩි දියුණු කිරීම්, විය පැහැදම් පාලනය හා අරපිරිමැස්ම සහ ව්‍යාපාරික කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමෙහි ලා ගතහැකි පියවර. කාර්මික භාරය වැඩි කිරීමේ මාර්ග හා දෙපාර්තමේන්තු ජනක ධාරිතාව වර්ධනය කිරීමේ ක්‍රම. ලිපි ගනුදෙනුව හා විමධ්‍යකරණය පිළිබඳ ක්‍රියා මාර්ගය, ගණන් තැබීමේ ක්‍රමය, මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසි. කාර්මික හා ලිපිකරු කාර්ය මණ්ඩල. යටත් කාර්මික සේවා නිලධාරීන්ගේ, කාර්මික සහකාරයින්ගේ සහ විදුලිය අධිකාරීන්ගේ වැටුප්, ගමන්, යැපීම් දීමනා, නිවාඩු, නිවාඩු කාල නිදහස් දුම්රිය ප්‍රවේශ පත්‍ර ආදිය. ආණ්ඩුවේ දෙපාර්තමේන්තු, අර්ධ ආණ්ඩු දෙපාර්තමේන්තු හා පෞද්ගලික පාර්ශ්වයන් සඳහා වැඩ පිළිබඳ ක්‍රියා මාර්ගය. වෙනස් වෙනස් මාර්ගවල කොන්ත්‍රාත්තු සග අනුගමනය කෙරෙන ක්‍රියා මාර්ගය. ඇස්තමේන්තු පිළියෙල කිරීම සහ ගණන් තැබීම සඳහා කාර්යාලවල තබා ගන්නා වෙනස් වෙනස් ගිණුම් පොත්. කර්මාන්ත ශාලාවේ සහ ගබඩාවේ මුදල් සැලැස්ම හා සංවිධානය විචාරාත්මකව සලකා බැලීම ; ගබඩා ආරක්ෂාව, පරීක්ෂාව හා පිරික්සීම. ඉන්ඩෙන්ටු සහ මෙරට ටැන්ඩර් පිළිබඳ ක්‍රියා මාර්ගය හා ඒ ක්‍රියා මාර්ගය විචාරාත්මකව සලකා බැලීම. කර්මාන්ත ශාලා බඩු සහ ගණන් තැබීම.

II. බල මධ්‍යස්ථාන ව්‍යවහාරය ... ... ... 100

යාන්ත්‍රික හා විදුලිය ඉංජිනේරු ශිල්පය පිළිබඳ ප්‍රශ්න පිළියෙල කරනු ලැබේ. ප්‍රායෝගික වශයෙන් ගැටලුවලට මුහුණ දෙන ආකාරය අතින් අපේක්ෂකයකු ලබා ඇති සමත්කම් නිශ්චය කිරීම සඳහා අංකමය ගැටලු ද අඩංගු වේ.

බල යන්ත්‍රාගාර අලුතින් පිහිටුවීම (සිහිල් කරන ක්‍රමය හා සහායකයන් ද ඇතුළුව) මූලික කරුණු, විශේෂ විස්තර, අත්හද බැලීම් හා වැඩෙනි යෙදවීම. එදිනෙද නඩත්තුව, අලුත් බල යන්ත්‍රාගාරවල සුළු අලුත්වැඩියා, පැරණි යන්ත්‍රාගාරවල විශාල අලුත්වැඩියාවන් හා මුළුමනින් සැකසීම, පැරණි යන්ත්‍රාගාර පවත්වාගෙන යාමේ හා ඉවත් කිරීමේ ආර්ථික න්‍යායයන්.

ඩීසල් සහ පැට්‍රෝල් ඇන්ජින් පිළිබඳ මූලධර්ම, ප්‍රධාන සංචලක හා විදුලි යන්ත්‍ර ක්‍රියා කරවීමේ විවිධ පාඩු සහ කාර්යක්ෂමතාවන්. ධාවන වියදම් සහ කාර්ය මණ්ඩල අවශ්‍යතා සහ කාර්යමණ්ඩල ප්‍රයෝජනයට ගැනීම. නගර සම්පාදන ක්‍රමයන්ගේ කාර්ෂයක්ෂමතා හා ආර්ථික ක්‍රියාකාරිත්වය සඳහා ඉන්ධන හා අමතර කොටස් පිළිබඳ අවශ්‍යතා.

විවෘත හා සංවෘත සිහිල් කිරීමේ ක්‍රම, උෂ්ණත්ව හා පීඩන ව්‍යාප්තීන්, ජල පවිත්‍ර කිරීමේ මූලික ස්වරූප සහ ජලය සිසිල් කිරීමේ රසායනික උපක්‍රම. ස්නේහක ක්‍රම හා ඒවා පෙරීම ; ස්නේහනයේ මූලික අදහස්. අවශක්මතා සරල ධාරා සහ ප්‍රත්‍යාවර්තක ධාරා ජනක සහ උද්දීපකයන්. විදුලි යන්ත්‍ර වර්ග සහ එතීම, පරිමන්දනය හා අමෙවර ප්‍රතික්‍රියාව පිළිබඳ මූලික දැනුමක්.

විදුලිය හා යාන්ත්‍රික යන්ත්‍රාගාරවල ශීඝ්‍රතාව සකස් කිරීම, භාරයක වොට් සහිත හා වොට් රහිත අවයව බල සාධකය සහ දෛනික රූප සටහන් පිළිබඳ සරල ගැටලු.

යතුරු ගියර, වායු සහ තෙල් පරිපථ භෙදක, ජනකවල ප්‍රතියෝජක හා ආරක්ෂාව. විදුලිය පරිමාණ මැනීම පිළිබඳ මූලික දැනුමක්, සාමාන්‍ය බලස්ථාන ව්‍යවහාරයේ දී යෙදෙද ගත හැකි උපකරණ ඒකීකරණය හා සංඥකරණය.

ලෙඩ් ඇසිඩ් බැටරි නඩත්තුව හා භාවිතය, බල යන්ත්‍රාගාරය ධාවනය කිරීමේදී අවශ්‍ය වන ආරක්ෂක රෙගුලාසි හා ආරක්ෂා විධිවිධාන.

ලකුණු

III. විදුලිය යෝජනා ක්‍රම ... ... ... 100

ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි ක්‍රියා මාර්ගය—නාගරික විදුලිය යෝජනා ක්‍රමයක් සඳහා මූලික විමර්ශනය—ඒ ගැන ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආණ්ඩුවේ විදුලිය දෙපාර්තමේන්තුවෙන් තොග වශයෙන් සම්පාදනය ගැන හෝ ස්වීය ජනන මධ්‍යස්ථාන ඇතිවීම ගැන විශේෂ සැළකිල්ල ඇතිව, එවැනි යෝජනා ක්‍රමවල ආර්ථික ස්වරූපයන් කෙරෙහි බලපාන සාධකයන්—ටැන්ඩර් කැඳවීමට පළමු එවැනි යෝජනා ක්‍රමවල විශේෂ විස්තර හා පරිමාණ පත්‍ර පිළියෙළ කිරීම. නාගරික විදුලිය යෝජනා ක්‍රමයන්හි සාපේක්ෂ වියදම් හා සම්පාදන සංඛ්‍යා ලේඛන. නාගරික විදුලිය යෝජනා ක්‍රමයන් සඳහා ණය ලබා ගැනීමේ අයදුම්පත් පිළිබඳ ක්‍රියා මාර්ගය.

කුඩා බල මධ්‍යස්ථානවල සැලැස්ම හා අවශක්මතා ව්‍යාප්ති ක්‍රම—මුදුන් ව්‍යාප්ති ක්‍රම සඳහා සුදුසු කනු තෝරා ගැනීම සහ පිරික්සීම, පරීක්ෂණ පිළිබඳ ක්‍රියා මාර්ගය සහ නඩත්තු වැඩ හා ව්‍යාප්ති ක්‍රමයන් දියුණු කිරීම පිළිබඳ වාර්තා.

නගරවල විදුලිය යෝජනා ක්‍රමයන්හි මුහුණ පෑමට සිදුවන ගැටලු. ප්‍රාදේශීය විදුලිය යෝජනා ක්‍රමයන්හි ගාස්තු සටහන්.

නගර සභා, සුළු නගර සභා හා ගම්සභාවන්හි විදුලිය දෙපාර්තමේන්තුව සඳහා කර්මික හා ලිපිකරු නිලධාරි මණ්ඩලයේ සාමාන්‍ය සැකැස්ම හා සංවිධානය. විදුලිය කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව සමග ඇති සම්බන්ධය. ප්‍රාදේශීය බල මණ්ඩල හා ආණ්ඩුවේ විදුලිය කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවත් සමග ඇති වර්තමාන සම්බන්ධය සලකා බැලීම හා අනාගත සංවර්ධනය දෙසට ඇති විය හැකි නැඹුරුවීම්. ආණ්ඩුවේ විදුලි කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ අතිරේක අතිශක්මතා පද්ධතිය, ප්‍රාදේශීය බලමණ්ඩල යෝජනා ක්‍රමයන්හි වර්ධනය හා සංවර්ධනය කෙරෙහි බලපාන ආකාරය සලකා බැලීම.

ගෘහ කර්මාන්ත සංවර්ධනය සඳහා ග්‍රාමීය ප්‍රදේශ විදුලිවත් කිරීම.

විදුලිමය ගෘහෝපකරණ ජනප්‍රිය කිරීම හා ඒවා මිලයට ගැනීමේ පහසුකම්. දෛනික භාරය සංවර්ධනය. ලංකා විදුලි සම්පාදන කර්මාන්තය හා අනාගතය. ලංකා ආර්ථික සංවර්ධනයෙහි ඊට හිමි තැන.

වැදගත් : 1950 අංක 19 දරණ විදුලි ආඥපනත හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසි.

IV. ගොඩනැගිලිවල විදුලිය ස්ථාපනය ... ... 100

ගොඩනැගිලිවල විදුලිය සම්පාදන ද්‍රව්‍ය සඳහා විදුලිය ඉංජිනේරු විද්‍යායතනයේ රෙගුලාසි—ආලෝකනය හා බලය සඳහා කම්බි දැමීම හා ගොඩනැගිලිවල නඩත්තුව—ද්‍රව ආවරණය සහ කොපු ගතකළ පරිවරණය හා සන්නයනය කම්බි පථ ක්‍රමය කෙරෙහි විශේෂ සැළකිල්ල සහිතව කම්බි දැමීමේ ක්‍රමය—කම්බි පථ රූප සටහන්—විශාල සහ කුඩා විදුලිය ස්ථානයන් සඳහා පරිමාණ ගැනීම හා ඇස්තමේන්තු පිළියෙළ කිරීම—පාඨශාලා, කර්මාන්තශාලා, කාර්යාල, විශාල තට්ටු නිවාස, නාට්‍යශාලා, සිනමා හල්, ආරෝග්‍ය ශාලා කම්බි දැමීම—පංකා හා සීනු පරිපථ, සවිකිරීම—දෙමං පරිපථ, දෙමං සහ අන්තර පරිපථ. තහඩු දෙකේ සහ තහඩු තුනේ සීලිං රෝසස් භාවිතය—ගොඩනැගිලිවල සැපයුම් පාලනය හා බෙදා හැරීම. අතිශක්මතා හා අවශක්මතා කේබල් පිරිද්දීමේදී යොද ගන්නා ක්‍රම සහ ද්‍රව්‍ය. විශාල විදුලිමය මූළු තැන් ගෙවල් සඳහා උදුන් සහ අනිකුත් විදුලිය සම්පාදන ද්‍රව්‍ය සඳහා කම්බි යෙදීම. '' සමස්ත විද්‍යුත් අගාරය '' සහ එවැනි ස්ථාපනයන්ට ගැලපෙන වර්තමාන කම්බි පථ ක්‍රමයන් සඳහා අවශ්‍ය වැඩි දියුණු කිරීම්—ලොකු කුඩා මෝටර් යන්ත්‍ර ස්ථාපනය, අත්හද බැලීම හා ඒවායේ නඩත්තුව. මෝටර් ක්‍රියා කරවීමේ සම්පාදන ද්‍රව්‍ය. පොම්ප සහ ගෘහෝපකරණ සම්පාදනය හා අත්හද බැලීම සහ ඒවායේ නඩත්තුව. පාවිච්චියේ ඇති ලාම්පුවල වර්ග හා නිෂ්පාදනයන් සහ ඒවායේ ආරෝහණ ප්‍රමාණයන් හා අන්තරයන්.

ලෝහ සූත්‍රිකා ලාම්පු සහ වායු විසර්ජන ලාම්පු. ප්‍රතිදීප්ත ආලෝකනය, ඒවා සම්බන්ධි කොටස් හා සම්බන්ධ කිරීම්. ප්‍රතිදීප්ත පහන්වල ඇතිවන වැරදි හා ඒවා නිවැරදි කිරීම.

සියයේ කිලෝ වෝල්ට ඇම්පියර ධාරිතාවක් දක්වා කාර්මික ස්ථාපනයන් කම්බි යෙදීම හා අත්හද බැලීම්, ඇස්තමේන්තු තැනීම. කාර්මික ස්ථාපනයන් අත්හද බැලීම සහ නඩත්තුව, සතුටුදායක බල සාධකය හා වෝල්ටීයතාව අත්හද බැලීම. කුඩා හා විශාල ස්ථාපනයන්ට සේවා සම්බන්ධ කිරීම්—ඇස්තමේන්තු පිළියෙළ කිරීම—මුදුන්

හා බිම් යට සේවා සම්බන්ධ කිරීම—විශාල කාර්මික විදුලිය ස්ථාපනයන්ට සේවා සම්බන්ධ කිරීම—අවශක්මතා උප පෝෂක පනේල—සැපයුම් බෙද හැරීමේ පුවරු—අවසාන උප පරිපථ—අධික ධාරාවන්ගෙන් ආරක්ෂා වීමේ ක්‍රම—පරිපථයන්ට වන මළ බැඳීම්, කාන්දුවීම් හා යාන්ත්‍රික අලාභ හානි හා ඒවායින් ආරක්ෂා කිරීම, කාන්දු වාරක සවි කිරීම—විදුලිය ස්ථාපනයන් අත්හද බැලීම්, විදුලිය යන්ත්‍රවල දෝෂ සොයා ගැනීමට පිරික්සීම, වැරදි තැන් නිශ්චය කිරීම හා ඒවා නිවැරදි කිරීම.

විදුලිය සඳහා ස්ථාපනයක් සකස් කිරීමේදී විපථ සාධකය භාවිතය සහ ගොඩනැගිලිවල විදුලිය සම්පාදන ද්‍රව්‍ය පිළිබඳ රෙගුලාසි යටතේ අවසාන උප පරිපථයකට විපථ සාධකය යොද ගනු ලබන්නේ කවර තත්ත්වයන් යටතේ ද යනු.

වීථි ආලෝකනයේ ක්‍රම සම්පාදනය, සවි කිරීම හා නඩත්තුව—

භාවිතයේ ඇති ලාම්පු වර්ග—වර්තමාන ක්‍රමයන් වැඩි දියුණු කිරීම.

කුඩා හා විශාල ගොඩනැගිලි සඳහා වායු සමීකරණ උපකරණ සහ සග ඒවා නඩත්තු කිරීම—විදුලි සෝපාන අත්හද බැලීම හා නඩත්තු කිරීම සහ ඒවා ධාවනය කිරීමේ මූල ධර්ම.

කුඩා හා විශාල විදුලි ස්ථාපනයන් හා විදුලිය යන්ත්‍ර භූ ගත කිරීමේ ක්‍රම.

| | ලකුණු |
|---|---|
| V. සම්ප්‍රේෂණය හා බෙද හැරීම ... | ... 100 |

සාමාන්‍ය :—සැපයුම් ක්‍රම, මුදුන් මාර්ග, බිම් යට කේබල්, පෝෂක, බෙද හරින්නෝ, ප්‍රධාන සේවා මාර්ග, පරිනාමකයෝ, යතුරු ගියර, ආරක්ෂාව හා මීටර යෙදීම.

මුදුන් මාර්ග :—(අව ශක්මතා, එච්. අයි. සහ අති ශක්මතා).

රෙගුලාසි :—සන්නායකයෝ—සන්නායක ද්‍රව්‍ය—තඹ, ඇලුමිනියම්, වානේ කම්බි ඇලුමිනියම්, ගැල්වනයිස් වානේ ආදිය, කනු දැව, වානේ නළ, ලැටිස් වානේ, ශක්ති වර්ධිත කොන්ක්‍රීට් කණු, රේගල පොලු, ලැටිස් වානේ ස්තම්භ, දැව කණු ආරක්ෂා කර ගැනීම හා රසායන ප්‍රතිකර්ම, වානේ වැඩ පින්තාරු කිරීම හා ගැල්වනයිස් කිරීම. අන්තර ආධාරක, අංශක ආධාරක හා අග්‍ර ආධාරක සඳහා හරස් පොලු. රැඳවුම් සහ රැඳවුම් පිළිවෙල, රැඳවුම් කම්බි, රැඳවුම් පොලු, රැඳවුම් තහඩු, පරිවාරකකටු, සැකිලි පරිවාරක, කැප් පරිවාරක, පින් වර්ගයේ පරිවාරක, රැඳවුම් පරිවාරක සන්නායක, මූට්ටු සහ කලම්ප, ස්පන්දන පරිමන්දකයෝ ; සන්නායකයන් අතර ඉඩ තැබීම් හා පිළිවෙල වෙනස් කිරීම හා භූමියෙන් ඈත් කිරීම. පලිස් ආකාර බිම් කම්බි සහ භූමික බද්ධ සන්නායකයෝ භූ ගත කිරීම, දුර කථන දුම්රිය මං හා මහ මං හරහා බල මාර්ග දැමීම.

බිම් යට කේබල් (අව ශක්මතා, අති ශක්මතා සහ අතිරේක අති ශක්මතා).

කේබල් වර්ග, කේබල් දැමීම, පිරිද්දීම, පරිවාරක වර්ග හා සංයෝග කේබල් ධාරිතා බලයේ පරිවාරක ප්‍රතිරෝදය සහ කේබල් ප්‍රේරණය, කේබල් තාප ශීඝ්‍ර කරණය, කේබල්වල දෝෂ සොයා ගැනීම.

සම්ප්‍රේෂණය හා ගණන් බැලීම—ප්‍රතිරෝදය, තනි කලා හා තුන් කලා කේබල්වල හා කම්බිවල ධාරිතා බලය සහ බලා රෝහණය.

කම්බි, කේබල් පෝෂක හා බෙද හරින්නන් විධිමත් පාලනය හා වෝල්ටීයතාව හීනවීම. මුදුන් කම්බිවල හා බිම් යට කේබල්වල පිරි එන ධාරා ; බල සාධකය හා බල සාධකය නිවැරදි කිරීම, වෝල්ටීයතාව පාලනය හා විධිමත් කිරීමේ උපකරණ. ලඝු පරිපථ ධාරා. මුදුන් කම්බි සඳහා සරල ආධාරකයන්ගේ ශක්තිය. සන්නායකයන්ගේ එල්ලා වැටුම් හා ආතතිය. උදාසීන ධාරා භාභූ ගත කිරීම.

යතුරු ගියර ආරක්ෂාව හා මීටර කිරීම.

පරිපථ භේදකයන්ගේ, විභාජකයන්ගේ හා සේව නූල්වල ශීඝ්‍රතාව සකස් කිරීම. ප්‍රතියෝජක ධාරා සහ දියුණු කළ හැකි පරිමාණක. පරිමාණක, විදුලි මාර්ග, කේබල් පෝෂක හා බෙද හරින්නන්ගේ ආරක්ෂාව. ආලෝකනය හා ආරක්ෂාව. අති ශක්මතා, අව ශක්මතා සහ අතිරේක අති ශක්මතා සැපයුම්වල මීටර යෙදීමේ ව්‍යවහාරය.

අත්හද බැලීම.

බිම් යට කේබල්, මුදුන් මාර්ග, පරිමාණක සහ යතුරු ගියර. කණුවල යාන්ත්‍රික ශක්තිය.

නඩත්තුව.

මුදුන් මාර්ග, බිම් යට කේබල්, පරිමාණක සහ උප මධ්‍යස්ථාන උපකරණ.

ඇස්තමේන්තු තැනීම.

මුදුන් මාර්ග සහ බිම් යට කේබල්වල (අව ශක්මතා, අති ශක්මතා, සහ අතිරේක අති ශක්මතා) ලඝු දීර්ඝතා. පෝෂක, ව්‍යාප්තික හා උප මධ්‍යස්ථාන උපකරණ.

විශේෂ විස්තර.

අව ශක්මතා, අති ශක්මතා සහ අතිරේක අති ශක්මතා උප මධ්‍යස්ථාන සඳහා මුදුන් මාර්ග ද්‍රව්‍ය සහ බිම් යට කේබල් පරිමාණක හා යතුරු ගියර.

10. පළමුවෙන් ලිඛිත පරීක්ෂණය පවත්වනු ලැබේ. එහි ප්‍රතිඵල අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අපේක්ෂකයින් තෝරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපති.

1965 අගෝස්තු මස 23 දින,
තැ. පෙ. 530,
කොළඹ.

## පළාත් පාලන සේවය

### වෘත්තීය සුදුසුකම් නොලත් සහකාර ඉංජිනේරුවරුන්ගේ ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය—1965

(1965. 8. 27 දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පළ කර ඇති දැන්වීම බලන්න).

**විභාගයට ඇතුළත් වීමේ අයදුම්පත**

සැ. යු.—මෙම ආකෘති පත්‍රය අපේක්ෂකයාගේ අත් අකුරින් නිවැරදිවද, පැහැදිලිවද පුරවා 1965 සැප්තැම්බර් මස 14 වැනි දිනට හෝ ඊට පෙර හෝ "පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති, තැ. පෙ. 530, කොළඹ" යන ලිපිනයට ලැබෙන සේ, අපේක්ෂකයා දැනට සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධානතුමා මගින් ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

1. අපේක්ෂකයාගේ සම්පූර්ණ නම:———.
2. අපේක්ෂකයා දැනට සේවය කරන ප්‍රාදේශීය බල මණ්ඩලයේ නම: ———.
3. දැනට දරන තනතුර :———.
4. දැනට දරන තනතුරට පත්වීම් ලද දිනය :———
5. I ශ්‍රේණියේ විදුලි අධිකාරි තනතුරේ ස්ථිරකර සිටීද : ———.
6. අයදුම්කරු II ශ්‍රේණියේ විදුලි අධිකාරි තනතුරක් දරන්නේද :———. එසේ නම් කාර්යක්ෂමතා කඩයිම් විභාගය සමත් කොට තිබේද : ———.
7. පහත සඳහන් විෂයයන්ගෙන් ඔබ පෙනී සිටීමට අදහස් කරන විෂයයන් සඳහන් කරන්න (ඔව්, නැත යනුවෙන්) :—.
   i. දෙපාර්තමේන්තු සංවිධානය හා මුදල් :———.
   ii. බලමධ්‍යස්ථාන ව්‍යවහාරය :———.
   iii. විදුලි යෝජනා ක්‍රම:———.
   iv. ගොඩනැගිලිවල විදුලිය ස්ථාපනය :———.
   v. සම්ප්‍රේෂණය හා බෙද හැරීම :———.
8. ඔබ මීට පෙර මෙම විභාගයට පෙනී සිටියේද ? එසේ නම් සමත් විෂයයන් හා අවුරුද්ද සඳහන් කරන්න :———.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපතිතුමා,

මෙම ප්‍රාදේශීය බල මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ නියුක්ත ඉහත සඳහන් අපේක්ෂකයා...........වැනි දින සිට පළාත් පාලන විදුලිය අධිකාරීන්ගේ සේවයේ......වැනි ශ්‍රේණියේ සිටින බවත්, ඔහුගේ වැඩ සහ හැසිරීම සෑම විටම සතුටුදායකව පැවති බවත් මෙයින් සහතික කරමි. ඔහු විසින් ඔහුගේ අයදුම් පතේ සඳහන් කොට ඇති විස්තර නිවැරදි වේ.

———,
සභාපතිතුමා/නාගරික කොමසාරිස්,
ප්‍රාදේශීය බලමණ්ඩලය:———

දිනය :———.

# ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

## වෙන්නප්පුව උප නගර සභාව

### 1963.7.1 දින සිට 1963.12.31 දින දක්වා ආදායම් හා වියදම් ලේඛනය

**ආදායම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදායම ... ... | 10,720 54 | |
| බී.—මහා මාර්ග ... ... | — | |
| සී.—නගරසභා ගොඩනැගිලි හා ඉඩම් ... | 306 75 | |
| ඩී.—සනීපාරක්ෂාව ... ... | 3,431 60 | |
| ඊ.—මහජන විනෝදය ... ... | 6 0 | |
| | | 14,464 89 |
| **වෙනත් ලැබීම්** | | |
| 1. තැන්පත් මුදල් ... ... | 6,591 09 | |
| 2. අත්තිකාරම් ... ... | 833 99 | |
| 3. ණය ගණුදෙනු ... ... | — | |
| 4. විවිධ ණය කරුවෝ ... ... | 35,479 27 | |
| 5. විදුලිය ගිණුම් ... ... | 34,576 70 | |
| 6. අධිකතා සහ ඌණතා ගිණුම—සාමාන්‍ය | 7,845 60 | |
| 7. අධිකතා සහ ඌණතා ගිණුම—විදුලිය | — | |
| 8. විවිධ ණය හිමියෝ ... ... | — | |
| 9. ආදායම් එකතුකිරීමේ ගණුදෙනු :— | | |
| ඒ.—ඉඩම් ගාස්තු ... | 2,211 28 | |
| බී.—විදුලි හිඟ ... ... | 23,217 16 | |
| සී.—කඩකුලී ... ... | 2,004 80 | |
| ඩී.—වරෙන්තු ගාස්තු ... | 175 41 | |
| | | 1,12,935 30 |
| 63.7.1 වන දිනට ඉතිරි ... ... | | — |
| එකතුව ... | | 1,27,400 19 |

**වියදම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් ... ... | 12,970 87 | |
| බී.—මහා මාර්ග ... ... | 2,153 30 | |
| සී.—නගරසභා ගොඩනැගිලි හා ඉඩම් ... | 455 50 | |
| ඩී.—සනීපාරක්ෂාව ... ... | 9,735 82 | |
| | | 25,315 49 |
| **වෙනත් ගෙවීම්** | | |
| 1. තැන්පත් මුදල් ... ... | 2,876 0 | |
| 2. අත්තිකාරම් ... ... | 1,889 99 | |
| 3. ණය ගනුදෙනු ... ... | — | |
| 4. විවිධ ණය කරුවෝ ... | — | |
| 5. විදුලිය ගිණුම් ... ... | 30,492 34 | |
| 6. අධිකතා සහ ඌණතා ගිණුම—සාමාන්‍ය | — | |
| 7. අධිකතා හා ඌණතා ගිණුම—විදුලිය | 12 09 | |
| 8. විවිධ ණය හිමියෝ ... | 8,140 80 | |
| 9. ආදායම් එකතුකිරීමේ ගණුදෙනු :— | | |
| ඒ.—ඉඩම් ගාස්තු ... | 3,486 99 | |
| බී.—විදුලි හිඟ ... | 35,403 33 | |
| සී.—කඩකුලී ... ... | 3,235 80 | |
| ඩී.—වරෙන්තු ගාස්තු ... | 255 76 | |
| | | 85,793 10 |
| | | 1,11,108 59 |
| 63.12.31 වන දිනට ඉතිරි ... ... | | 16,291 60 |
| එකතුව ... | | 1,27,400 19 |

වෙන්නප්පුව උප නගර සභාවේ සභාපති තැන්පත් නානායක්කාර වර්ණකුල පටබැඳිගේ මයිකල් පෙස්ටස් ලාවුස් පෙරේරා වන මම, ඉහත සඳහන් වාර්තාව මගේ සම්පූර්ණ දැනීමේ හැටියට හා විස්වාසයේ හැටියට 1963.7.1 දින සිට 1963.12.31 වන දින දක්වා වෙන්නප්පුව උප නගර සභාවේ ලැබීම් හා ගෙවීම් පිළිබඳ නිවැරදිවූත් සත්‍යවූත් වාර්තාවක් බව සහතික කරමි.

ඇම්. ඇෆ්. ඩබ්ලිව්. පෙරේරා,
සභාපති.

නිවැරදි බවට සහතික කරනලදී,

කේ. ටී. ඇම්. පෙරේරා,
සාමාජික.

1964 අගෝස්තු මස 29 වැනි දින මා ඉදිරිපිට මාවිල දි සහතික කරන ලදී,

ඇල්බට් ඇෆ්. පීරිස්,
සමාදාන විනිශ්චයකාර තැන.

### 1963 නේ දෙසැම්බර් 31 වන දිනට වත්කම් හා බැරකම් ලේඛනය

**බැරකම්**

| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| තැන්පත්—සාමාන්‍ය ... ... | | 1,993 09 | |
| විදුලි පාරිභෝගික ස්ථාවර තැන්පත් මුදල් ... ... | | 1,100 0 | |
| ප්‍රධාන විදුලිසේවා කම්බි සඳහා ඇප මුදල් ... ... | | 622 0 | |
| | | | 3,715 09 |
| විවිධ ණය කරුවෝ ... ... ... | | | 35,479 27 |
| 63.7.1 වන දිනට ඌණතාවය—විදුලිය ... | | 12 09 | |
| 1963 ට අධිකය : | | | |
| ආදායම ... | 34,576 70 | | |
| වියදම ... | 30,492 34 | | |
| | | 4,084 36 | |
| | | | 4,072 27 |
| එකතුව ... | | | 43,266 63 |

**වත්කම්**

| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| අත්තිකාරම් ... ... ... | | | 1,056 0 |
| විවිධ ණය හිමියෝ ... ... ... | | | 8,140 80 |
| ආදායම් එකතුකිරීමේ ගණුදෙනු— | | | |
| දේපොල බද්ද ... | 1,275 71 | | |
| කඩ කුලී ... | 1,231 0 | | |
| විදුලි ගාස්තු ... | 12,186 17 | | |
| වරෙන්තු ගාස්තු ... | 80 35 | | |
| | | | 14,773 23 |
| 1963.7.1 වන දිනට අධිකය ... | | 7,845 60 | |
| 1963 ට හිඟය : රු. ශ. | | | |
| වියදම ... 25,315 49 | | | |
| ආදායම ... 14,464 89 | | | |
| | | 10,850 60 | |
| | | | 3,005 0 |
| මුදල් ඉතිරිය ... ... | | | 16,291 60 |
| එකතුව ... | | | 43,266 63 |

වෙන්නප්පුව උප නගර සභාවේ සභාපති තැන්පත් නානායක්කාර වර්ණකුල පටබැඳිගේ මයිකල් පෙස්ටස් ලාවුස් පෙරේරා වන මම, ඉහත සඳහන් වාර්තාව මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1963 නේ වර්ෂයේ දෙසැම්බර් 31 වන ද වන විට, වෙන්නප්පුව උප නගර සභාවේ වත්කම් හා බැරකම් ලේඛනයේ නිවැරදිවූත්, සත්‍යවූත් වාර්තාවක් බව සහතික කරමි.

නිවැරදි බවට සහතික කරමි.

කේ. ටී. ඇම්. පෙරේරා,
සාමාජික.

ඇම්. ඇෆ්. ඩබ්ලිව්. පෙරේරා,
සභාපති.

1964 අගෝස්තු මස 29 වැනි දින මා ඉදිරිපිට මාවිල දී සහතික කරන ලදී.

ඇල්බට් ඇෆ්. පීරිස්,
සමාදාන විනිශ්චයකාර තැන.

8—1087—65.8.27 දින අංක 14,490 දරණ ගැසට් පත්‍රය

---

# අය වැය ලේඛන

## මුල්ලේරියාව සුළු නගර සභාව

### මුදල් රෙගුලාසි 40 (ii) යටතේ ඉල්ලුම් පත්‍රයයි

1 කොටස

1965 වර්ෂයේ අයවැය ලේඛනයේ මුදල් ඉතුරුවේයයි ගණන් බලා ඇති වැය ශීර්ෂයන්ගෙන් මදිවේයයි ගණන් බලා ඇති වැය ශීර්ෂවලට මාරු කිරීමට 1965 ජුලි මස 20 දින පවත්වන ලද මාසික රැස්වීමේ අංක 8 දරණ සභා තීරණයෙන් සභා සම්මත කර ගන්නා ලදී ;—

මුදල් ඉතිරිවේයයි ගණන් බලා ඇති වැය ශීර්ෂ

| | | රු. | ශ. |
|---|---|---|---|
| ඒ. 2 (කේ) කාර්යාල භාණ්ඩ හා උපකරණ | ... | 3,662 | 0 |
| බී. 13 ජීවනාධාර හා විශේෂ ජීවනාධාර | ... | 500 | 0 |
| ඩී. 2 (ඊ) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර | ... | 500 | 0 |
| | | 4,662 | 0 |

මුදල් මදිවේයයි ගණන් බලා ඇති වැය ශීර්ෂ

| | | | රු. | ශ. |
|---|---|---|---|---|
| ඒ. 1 (බී) ලිපිකරුවෝ | ... | ... | 1,875 | 0 |
| ඒ. 1 (ජී) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර | | .. | 1,787 | 0 |
| ඒ. 2 (බී) ගමන් ගාස්තු | ... | ... | 500 | 0 |
| ඒ. 2 (ඇෆ්) ලිපිද්‍රව්‍ය, මුද්‍රණ ප්‍රකාශන හා මුද්‍රණ ගාස්තු... | | | 500 | 0 |
| | | | 4,662 | 0 |

කේ. ඒ. ඩී. කරුණාරත්න,
සභාපති,
මුල්ලේරියාව සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
මුල්ලේරියාව, 26.7.65.

අනුමත කරමි.

ඩබ්ලිව්. ඊ. ටී. ඇස්. ද අල්විස්,
සහකාර පළාත් පාලන කොමසාරිස්.

සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේදී ය.
බම්බලපිටිය, 14.8.1965.

8–1084—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## රත්තොට සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් රෙගුලාසි 40 (i) යටතේ අයදුම්පත

### අය වැය ලේඛනය 1965—තුන්වන පුරකවැය ශීර්ෂය

සාමාන්‍ය කොටස

| වැය ශීර්ෂය | | | සම්මතවූ මුදල රු. | ශ. | සභා සම්මුති අංකය හා දිනය |
|---|---|---|---|---|---|
| බී. 1 (බී) | ... | ... | 115 | 0 | යෝජනා අංක 2(9) 1965.8.19 දින |
| සී. 1 | ... | ... | 705 | 0 | |
| සී. 8 | ... | ... | 75 | 0 | |
| ඩී. 2 (ඒ) | ... | ... | 1,325 | 0 | |

ධර්මවතී වික්‍රම පතිරණ,
සභාපතිනිය,
සුළු නගර සභාව, රත්තොට.

1965 අගෝස්තු මස 21 දින,
රත්තොට සුළු නගර සභා කාර්යාලයේදීය.

8–1065—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## වාද්දුව සුළු නගර සභාව

### 1965 අංක 2 දරණ අතුරු වැය ලේඛනය—1 වැනි කොටස

| වැය ශීර්ෂය | | | | රු. | ශ. | |
|---|---|---|---|---|---|---|
| ඒ. 1 බී.—ලිපිකරු වැටුප් | ... | ... | ... | 750 | 0 | 1965 අගෝස්තු 16 වැනි දින අංක 4(1) දරණ යෝජනාවෙන් සභා සම්මත විය. |
| බී. 1 සී.—කම්කරු වැටුප් | ... | ... | ... | 1,000 | 0 | |
| බී. 2 පාරවල් නඩත්තු කිරීම | ... | ... | ... | 2,500 | 0 | |
| සී. 7 අළුත් වැඩ සඳහා | ... | ... | ... | 2,500 | 0 | ... 1965 අගෝස්තු 16 වැනි දින අංක 6(8) දරණ යෝජනාවෙන් සභා සම්මත විය. |

2 වැනි කොටස—විදුලි අංශය

| වැය ශීර්ෂය | | රු. ශ. | |
|---|---|---|---|
| ඊ. ඇල්. 4 සී. විදුලි අංශයේ ලිපි ද්‍රව්‍ය | ... ... | 500 0 | ... 1965 අගෝස්තු 16 වැනි දින අංක 4 (1) දරණ යෝජනාවෙන් සභාසම්මත විය. |

පී. ඇෆ්. ඇම්. ප්‍රනාන්දු,
සභාපති.

1965 අගෝස්තු මස 17 වැනි දින,
වාද්දුව සුළු නගර සභා කාර්‍යාලයේදීය.

8–1091—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## පොල්ගහවෙල සුළු නගර සභාව

**1965 වර්ෂයේ පළමු වැනි අතුරු අයවැය ලේඛනය**

1 වැනි කොටස—සාමාන්‍ය

| වැය ශීර්ෂය | | රු. | ශ. |
|---|---|---|---|
| 1. මහජන සෞඛ්‍ය.— | | | |
| ඩී. 1 (එච්) කාණු තැනීම | ... ... | 1,000 | 0 |
| 2. කුණු කසළ ශෝධනය.— | | | |
| ඩී. 2 (බී) කරත්ත, ගොන් සහ ලොරි ... | ... | 1,416 | 0 |
| 3. වැසිකිළි ශෝධනය.— | | | |
| ඩී. 3 (බී) කරත්ත ගොන් සහ ලොරි ... | ... | 1,416 | 0 |
| | | 3,832 | 0 |

1965ක්වූ පෙබරවාරි මස 25 වැනි දින අංක 6 දරන යෝජනාවෙන් හා අප්‍රේල් මස 29 වැනි දින අංක 13 දරණ යෝජනාවෙන් සභා සම්මත කරන ලදී.

ඇස්. රණසිංහ,
සභාපති,
සුළු නගර සභාව, පොල්ගහවෙල.

සුළු නගර සභා කාර්යාලය,
පොල්ගහවෙල,
1965.8.20.

8–1069—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## පිළියන්දල සුළු නගර සභාව

**සුළු නගර සභා මුදල් රෙගුලාසි අංක 40 (i) දරණ කොටස යටතේ අයදුම් පත**

1965 අය වැය ලේඛනය

1965 අය වැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂ යටතේ වෙන්කරන ලද මුදල්වලින් ඉතිරිවේයයි ගණන් බලන ලද පහත දැක්වෙන ශීර්ෂය යටතේ මුදල් ඊට අනුරූපව දැක්වෙන වැය ශීර්ෂවලට මාරුකර අවශ්‍යවී තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදීමට 1965 ක්වූ ජූලි මස 5 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ අංක 23 දරණ යෝජනාවෙන් සම්මතවිය.

1 වැනි කොටස—සාමාන්‍ය

**ඉතිරි මුදල් වැය ශීර්ෂය**

| | | රු. | ශ. |
|---|---|---|---|
| ඩී.—මහා මාර්ග— | | | |
| 7. අත්පත්කර ගැනීම් | ... ... | 2,000 | 0 |
| එකතුව | ... | 2,000 | 0 |

**වැඩිපුර වියදම් වැය ශීර්ෂය**

| | | රු. | ශ. |
|---|---|---|---|
| ඩී.—මහා මාර්ග— | | | |
| 2. නඩත්තු කිරීම් | ... ... ... | 1,000 | 0 |
| ඩී.—සනීපාරක්ෂාව— | | | |
| 1. (එච්) කාණු ඉදිකිරීම | ... ... | 1,000 | 0 |
| එකතුව | ... | 2,000 | 0 |

සෝමවීර චන්ද්‍රසිරි (පා. මන්ත්‍රී),
සභාපති,
පිළියන්දල සුළු නගර සභාව.

1965, අගෝස්තු මස 16 වැනි දින,
පිළියන්දල සුළු නගර සභා කාර්යාලයේ දීය.

8–1072—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## තිස්සමහරාම සුළු නගර සභාව

**මුදල් රෙගුලාසි නීති අංක 40 (ii) යටතේ කෙරෙන අයදුම් පත්‍රයයි**

අය වැය ලේඛනය—1965

1965 අය වැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂ යටතේ වෙන් කරන ලද මුදල් වලින් ඉතිරිවේයයි ගණන් බලන ලද පහත දැක්වෙන ශීර්ෂ යටතේ මුදල් ඊට අනුරූපව දැක්වෙන වැය ශීර්ෂවලට මාරු කර අවශ්‍යව තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදීමට 1965 ජූලි මස 29 වැනි දින පවත්වන ලද තිස්සමහරාම සුළු නගර සභාවේ මාසික රැස්වීමේදී අංක 8 දරණ යෝජනාවෙන් මාතර පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව සභා සම්මත විය.

**ඉතිරි මුදල් වැය ශීර්ෂය**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ 2 (සී) අයකැමි ගාස්තු ... ... ... | 200 | 0 |
| ඒ 2 (ඇල්) රෝහල් ගාස්තු ... ... | 200 | 0 |
| ඒ 5 පාසැල් පොත් බෙදීම සඳහා වියදම් ... ... | 165 | 0 |
| බී 1 (සී) කම්කරුවෝ ... ... ... | 200 | 0 |
| බී 3 යන්ත්‍ර සහ ආයුධ ... ... ... | 100 | 0 |
| එකතුව ... | 865 | 0 |

**වැඩිපුර වියදම් වැය ශීර්ෂය**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ 2 (බී) ගමන් ගාස්තු ... ... ... | 500 | 0 |
| ඒ 2 (එෆ්) ලිපි ද්‍රව්‍ය මුද්‍රණ ප්‍රකාශන, සහ මුද්දර ගාස්තු ... | 365 | 0 |
| එකතුව ... | 865 | 0 |

2 වන කොටස—විදුලි අංශය

| | | |
|---|---|---|
| ඊ ඩී 2 (ඒ) ගොඩනැගිලි ... | 1,500 | 0 |
| ඊ ඩී 10 ජීවන ආධාර ... ... ... | 1,000 | 0 |
| එකතුව ... | 2,500 | 0 |

| | | |
|---|---|---|
| ඊ ඩී 2 (සී) මාපක යන්ත්‍ර විදුලිය යතුරු හා වෙනත් වැඩ ... | 1,500 | 0 |
| ඊ ඩී 4 (බී) බාහිර සේවක වේතන හා දීමනා ... | 1,000 | 0 |
| එකතුව ... | 2,500 | 0 |

එම්. එම්. මෛත්‍රීපාල,
සභාපති,
තිස්සමහරාම සුළු නගර සභාව.

තිස්සමහරාම සුළු නගරසභා කාර්‍යාලය,
1965 අගෝස්තු මස 4 වැනි දින.

අනුමත කරන ලදී.

එච්. ඒ. පී. අභයවර්ධන,
පහළ දකුණු දිසාවේ පළාත් පාලන සහකාර කොමසාරිස්.

මාතර,
1965 අගෝස්තු 18 දින.

8–1073—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## තිස්සමහරාම සුළු නගර සභාව

### 1965 වර්ෂයේ තෙවන අතිරේක අයවැය ලේඛනය

### I වන කොටස

| | රු. | ශ |
|---|---|---|
| ඩී 5 සී ජල සම්පාදනය— නඩත්තු කිරීම ... ... ... ... ... ... | 3,500 | 0 |

1965 ජූලි මස 29 දින පවත්වන ලද මාසික රැස්වීමේ දී අංක 4 (1) දරණ යෝජනාව අනුව අනුමත කරන ලදී.

එම්. එම්. මෛත්‍රීපාල,
සභාපති,
තිස්සමහරාම සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
තිස්සමහරාම, 1965 අගෝස්තු 4 දින.

අනුමත කරන ලදී.

එච්. ඒ. පී. අභයවර්ධන,
පහල දකුණු දිසාවේ පළාත් පාලන
සහකාර කොමසාරිස්.

මාතර,
1965 අගෝස්තු 18 දින.

8–1074—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

## දොඩන්දූව උප නගර සභාව

### 1965 වර්‍ෂය සඳහා වරිපනම් පොත්

1965 වර්ෂය සඳහා කොට්ඨාස අංක 1, 2, 3, 4 හා 5 වෙනුවෙන් පිළියෙල කරනලද වරිපනම් පොත් දැනට සූදානම් බවත්, කාර්යාලීය වේලාවන් හි දී, එය පරීක්‍ෂා කළහැකි බවත්, සුළු නගර සභා ආඥා පනතේ (256 පරිච්ඡේදය) 165 කාණ්ඩය හා සම්බන්ධ වූ නාගරික සභා ආඥාපනතේ (252 වන පරිච්ඡේදය) 235 (1) කාණ්ඩය යටතේ මෙයින් මහජනයා වෙත දැනුම් දෙමි.

බී. ජේ. ජයවර්ධන,
දොඩන්දූව උප නගර සභාවේ සභාපති.

දොඩන්දූව උප නගර සභාව,
දොඩන්දූව,
1965.8.17.

8–1081—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## ආනයිවිලුන්දන් පත්තු ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අයවලුන් විසින් 1965 වර්ෂයට මස්කඩ පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලුම්කර සිටින බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීමට ආනයිවිලුන්දන් පත්තු ගම් ප්‍රදේශය තුළ යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන්කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දැනුම්දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. ඩබ්ලිව්. පී. වින්සන් පෙරේරා, සෙන්ගල්ඔය, නල්ලදරන්කට්ටුව ... | ඌරුමස් වෙළඳාම ... | රාජකදලුවේ පිහිටි රාජකදලුව වත්ත යන ඉඩමේ ඇති කඩය |
| 2. ඩබ්ලිව්. වින්සන් දබරේරා, වෙල්ලවල, බත්තුලුඔය ... | එම ... | බත්තුලුඔය "රෝඩ්සයිඩ්" නමැති ඉඩමේ ඇති කඩය |
| 3. ඩබ්ලිව්. වින්සන් දබරේරා, වෙල්ලවල, බත්තුලුඔය ... | හරක්මස් වෙළඳාම ... | එම |

වී. ඊ. ජාන්ස,
ආනමඩුවේ පත්තු ගම්සභාවේ
සභාපති.

ගම්සභා කාර්යාලය,
ආරච්චිකට්ටුව, රාජකදලුව.
1965 අගෝස්තු මස 17 දින.

8–1083—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## දෙහිඕවිට සුළු නගර සභාව

**1965 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද**

**256 වෙනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනත**

දෙහිඕවිට සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

(1) 256 වෙනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ අංක 161 දරණ වගන්තිය යටතේ පහත උපලේඛනයේ විස්තර වන ගණන් අනුව, 1965 අවුරුද්දට රථවාහන හා සතුන් සඳහා බද්දක් පනවා අයකිරීමටද,

(2) එකී ආඥාපනතේ 162 (3) වගන්තිය යටතේ එකී බදු 1965 සැප්තැම්බර් මස 30 වැනිදාට හෝ ඊට පෙර ගෙවිය හැකි අයුරින් ද වේ.

### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක්, හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් හෝ රෝදත්‍රයේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් | 1 | 0 |
| ඕනෑම අත්දමක ගොන් දෙන්නා බැඳි සෑම බරකරත්තයක් සඳහා ... ... | 3 | 0 |
| තනි ගොනා බැඳි සෑම බරබාගයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 2 | 50 |
| සෑම අත්කරත්තයක් සඳහා ... ... | 2 | 50 |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... | 3 | 0 |

කේ. ඩී. බී. කැකිඹියස්,
සභාපති,
දෙහිඕවිට සුළු නගර සභාව.

1965 අගෝස්තු මස 13 වැනි දින,
දෙහිඕවිට සුළු නගර සභා කාර්යාලයේදීය.

8–1080—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## දඹුල්ල සුළු නගර සභාව

**1965 වැනි වර්ෂයට රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද**

**සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය)**

දඹුල්ල සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

(1) සුළු නගර සභා ආඥාපනතේ අංක 161 දරණ වගන්තිය යටතේ පහත දැක්වෙන උපලේඛනයෙන් විස්තර වන ගණන් අනුව 1965 වැනි වර්ෂයට රථවාහන සහ සතුන් සඳහා බද්දක් පනවා අය කිරීමටද,

(2) එකී ආඥාපනතේ අංක 162 (3) වැනි වගන්තිය යටතේ එකී බදු 1965 මාර්තු මස 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම ගෙවිය හැකි අයුරින් ද වේ.

වී. ජී. උක්කුරාල,
සභාපති.

1965 මැයි මස 31 වැනි දින,
දඹුල්ල සුළු නගර සභා කාර්යාලයේදීය.

### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, කරත්ත, අත්කරත්ත, ජින් රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙනයම් සෑම වාහනයක් වෙනුවෙන් ... | 5 | 0 |
| සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් නොහොත් රෝදත්‍රයේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් :— | | |
| (ඒ) වෙළඳාම සඳහා පාවිච්චි කෙරේ නම් ... | 2 | 50 |
| (බී) වෙළඳාමට හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කෙරේනම් ... ... | 1 | 0 |
| ගොන් දෙන්නා බැඳි සෑම කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 4 | 0 |
| තනි ගොනා බැඳි සෑම බරබාගයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 2 | 50 |
| සෑම අත්කරත්තයක් සඳහා ... ... | 2 | 0 |
| සෑම බූරුවෙකුට හෝ ගොනෙකුට ... ... | 1 | 0 |

8–1079—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## දළුගම සුළු නගර සභාව

**1965 වර්ෂයේ වරිපණම් ලේඛන**

1965 වර්ෂය වෙනුවෙන් පිළියෙලවී ඇති දළුගම සුළු නගර සභාවේ වරිපණම් ලේඛන රාජකාරී වේලාවන් තුළ මෙම කාර්යාලයේදී පරීක්ෂා කිරීම සඳහා විවෘතව ඇති බව (256 අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ අංක 165 දරණ වගන්තිය අනුව කියැවෙන (252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ අංක 235 (1) දරණ වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආර්. ඇස්. පෙරේරා,
සභාපති,
දළුගම සුළු නගර සභාව.

දළුගම සුළු නගර සභා කාර්යාලය,
මහර-කඩවත,
1965.8.17 දින දීය.

8–1078—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

## ලුණුගල සුළු නගර සභාව

### ජලභීතිකා රෝගය

ලුණුගල සුළු නගර සභා සීමාව තුළ ජලභීතිකා රෝග උවදුර පවතින බැවින්, එම නගර සීමාව තුළ පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ, අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන, දඬාවතේ යන නැත හොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ, කිසියම් සුනඛයෙකු (බල්ලෙකු හෝ බැල්ලියෙකු), මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් ඒවේලේම විනාශ කරනු ලබන බව, (ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වෙනි පරිච්ඡේදය වන) ජලභීතිකා ආඥාපනතේ 11 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මෙම ප්‍රකාශනය මෙදින සිට හය මාසයක කාලයක් බලපවත්වනවා ඇත.

ඩී. ඩී. ඊ. විජේසේකර,
වැඩබලන සභාපති,
සුළු නගර සභාව, ලුණුගල.

1965. 8. 16 දින,
ලුණුගල සුළු නගර සභා කායර්ාලයයේ දී ය.

8–1070—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## දැන්වීමයි

වර්ෂ 1957 අංක 59 දරන විදුලි බල (සංශෝධන) පනතින් සංශෝධිත වර්ෂ 1950 අංක 19 දරන විදුලි බල පනතේ 9 වැනි ඡේදය සහ ඒ යටතේ අංක 10,899 සහ 1956 මාර්තු 2 දින දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද රෙගුලාසීන් ප්‍රකාර මා වෙත පැවරී ඇති බලය අනුව, වත්තල-මාබෝල නගර සභාවට නිකුත් කර ඇති විදුලිය බලපත්‍රයේ (අ) උපලේඛනයේ සඳහන් විදුලිය සැපයීමේ බලයලත් ප්‍රදේශය කෙටි කිරීම සම්බන්ධයෙන් ඉහත සඳහන් රෙගුලාසීන් යටතේ 1965 සැප්තැම්බර් මස 13 වැනි දින පස්වරු 2.30 ට වත්තල-මාබෝල නගර සභා කාර්යාලයේ දී විභාගයක් පවත්වනු බව සියළු දෙනාටම මෙයින් දැනුම් දෙනු ලැබේ.

කෙටි කරන ලද ප්‍රදේශවල මායිම් :—

"වර්ෂ 1960 මැයි මස 6 වැනි දින අංක 12,125 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත පරිදි සියළුම ප්‍රදේශ"

මෙම විභාගය සම්බන්ධව කරුණු ඉදිරිපත් කිරීමට කැමති සියළුම පුද්ගලයින් පිටපත් තුනකින් සමන්විත එම කරුණු කවරයක බහා මුද්‍රා තබා ප්‍රධාන විදුලිය පරීක්ෂක තැන, තැ. පෙ. 540, කොළඹ යන ලිපිනය සඳහන් ලිපිය 1965 සැප්තැම්බර් මස 1 වැනි දින පෙරවරු 10ට පෙර විදුලිය පරීක්ෂක තුමාගේ කාර්යාලයට බාරදිය යුතුය. නැතහොත් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

කරුණු සම්බන්ධ වැඩිමනත් විස්තර මෙම දැන්වීමේ පළමුවැනි කොටසේ සඳහන් ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද රෙගුලාසීන් බලනු මැනවි.

ඩී. ආර්. සී. ද අල්විස්.
විදුලිය පරීක්ෂක.

ප්‍රධාන විදුලිය පරීක්ෂක තුමාගේ කාර්යාලය,
තැ. පෙ. 540, කොළඹ,
1965 අගෝස්තු මස 13 වැනි දින දී ය.

8–1090—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඩ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.**

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි